# නියෝජ්‍යත්ව නීතිය

## විෂය නිර්දේශය අනුව බර තැබීම - 10 %

## පරිච්ඡේද අන්තර්ගතය

- ⇨ නියෝජ්‍යත්වය ඇතිවන ආකාරය
- ⇨ නියෝජිතයන් වර්ග
- ⇨ නියෝජිතයෙකුගේ බලය ( අධිකාරිය )
- ⇨ නියෝජිතයෙකුගේ යුතුකම් සහ අයිතිවාසිකම්
- ⇨ නියෝජ්‍යත්වය අවසන් වීම
- ⇨ ගිවිසුම් සම්බන්ධයෙන් නියෝජිතයෙකුගේ වගකීම
- ⇨ නියෝජිතයෙකුගේ කටයුතු සඳහා රජයේ වගකීම

# නියෝජ්‍යත්ව නීතිය හැඳින්වීම

- මෙරට නියෝජ්‍යත්ව නීතිය ඉංග්‍රීසි නීතිය මත පදනම්ව ඇත.
- 1852 අංක 5 දරණ සිවිල් නීති ආඥා පනත ප්‍රකාරව එම පනත පැනවීමෙන් පසුව නියෝජ්‍යත්ව නීතියට අදාලව මෙරට තුල විසඳිය යුතු සියලුම කාරණා වලට අදාලව බලාත්මක කල යුත්තේ වෙනත් පනතකින් අන්‍යාකාරයෙන් විධිවාධාන සැලැසුවුවහොත් මිස එන්ගලන්තයේ මීට සමාන අවස්ථාවලදී යොදා ගන්නා නීතීන් අනුවය.
- නියෝජ්‍යත්ව නීතියේදී ප්‍රධාන පාර්ශව තුනක් ඇත. එනම්,

  01. ප්‍රධානියා


  02. නියෝජිත

  03. තුන්වන පාර්ශවය ලෙසය.

⏭⏭ නියෝජ්‍යත්ව නීතියේදී සිදුවන්නේ ප්‍රධානියා යැයි හඳුන්වනු ලබන තැනැත්තෙකු හට යම් කාර්යක් සිදු කිරීමට අවශ්‍යව ඇති අවස්ථාවකදී එකී කාර්යය විවිධ හේතු මත තමා විසින් සිදු නොකර නියෝජිතයා යැයි හඳුන්වනු ලබන තැනැත්තෙකු හරහා සිදු කර ගැනීමයි. ⏮⏮

## පහත සටහන බලන්න

මෙහිදී ප්‍රධානියා සෘජුවම තෙවන පාර්ශවය සමග ගිවිසුම් / ගනුදෙනු වලට නොඑලඹෙන අතර, නියෝජිතයා විසින් ප්‍රධානියා වෙනුවෙන් තෙවන පාර්ශවය සමග ගිවිසුම් වලට එලඹීමක් මෙහිදී සිදුවේ.




ඒ අනුව “ **අනුන් ලවා කරවීම , තමන් විසින් කිරීමම වේ** ” **යන ආප්තය මත නියෝජ්‍යත්ව නීතිය පදනම් වී ඇත.**

- ඒ අනුව නියෝජ්‍යත්ව නීතියේදී නියෝජිතයා යනු ප්‍රධානියා සහ තෙවන පාර්ශවය සම්බන්ධ කරනු ලබන අතරමැදියෙකි.
- නියෝජ්‍යත්ව නීතියේදී ප්‍රධානියා කවුද ? , නියෝජිතයා කවුද ? , තෙවන පාර්ශවය කවුද ? , ප්‍රධානියා විසින් තෙවන පාර්ශවය වෙත පවරන ලද කාර්යය කුමක්ද ? යන කාරනා ඉතා වැදගත්ය.
- **නියෝජිතයා යනු** ප්‍රධානියා යනුවෙන් හඳුන්වනු ලබන යම් තැනැත්තෙක් වෙනුවෙන් ප්‍රධානියා විසින් තමන් වෙත පවරනු ලැබූ යම් කාර්යයක් ඉටු කරනු ලබන්නෙකි.
- **ප්‍රධානියා යනු** නියෝජිතයාව පත් කරනු ලබන තැනැත්තාය. ( එසේ නැතහොත් නියෝජිතයා කටයුතු කරන්නේ යම් තැනැත්තෙක් වෙනුවෙන්ද ? එම යම් තැනැත්තා ප්‍රධානියාය. )
- ප්‍රධානියා සහ නියෝජිතයා අතර ඇති සම්බන්ධතාවය **නියෝජ්‍යත්වය** හෝ **නියෝජ්‍යත්ව ගිවිසුම** ලෙස හැඳින්වේ.
- **තෙවන පාර්ශවය** යනු නියෝජිතයාගේ මැදිහත් වීම මත ප්‍රධානියා සමග යම් නිශ්චිත ගිවිසුමකට එලඹෙන පාර්ශවයකි.
- **කාර්යය** යනු ප්‍රධානියා විසින් තමා වෙනුවෙන් ඉටු කිරීම සඳහා ප්‍රධානියා විසින් නියෝජිතයාට බලය ලබා දුන් ක්‍රියාවයි.

- පහත උදාහරණය සලකන්න.

- අමල් ට නවීන පන්නයේ භාවිතා කරන ලද කාර් රථයක් මිලදී ගැනීමට අවශ්‍යව ඇත. එහෙත් ඔහුට කාර් රථ පිලිබඳ දැනුම හෝ ඒ පිලිබඳව උනන්දුවක් සහ ඊට කාලය වෙන් කර ගැනීමේ හැකියාවක් නැත. එම නිසා ඔහු කමල් අමතා ප්‍රකාශ කර සිටින්නේ තමාට සුදුසු කාර් රථයක් කමල් විසින් තමන්ට සොයා දෙනු ලැබුවහොත් තමා ඒ සඳහා රුපියල් 25000/- ක කොමිස් මුදලක් ඔහු වෙත ලබා දෙන බවයි.

  කමල්ද ඊට එකඟ වන අතර පසුව කමල් විසින් විවිධ කාර් රථ කිහිපයක් පිලිබඳව අමල්ට නිර්දේශ කරනු ලබන අතර ඒ අනුව කමල් විසින් නිර්දේශ කරනු ලැබූ විමල්ගේ කාර් රථය මිලදී ගැනීම සඳහා අමල් , විමල් සමග ගිවිසුමකට එලඹෙන අතර, ඉහත සඳහන් එකඟතාවය ප්‍රකාරව අමල් විසින් කමල්ට රුපියල් 25000/- ක කොමිස් මුදල ලබා දෙයි.

  ප්‍රධානියා කවුද ? , නියෝජිතයා කවුද ? , තෙවන පාර්ශවය කවුද ? , ප්‍රධානියා විසින් තෙවන පාර්ශවය වෙත පවරන ලද කාර්යය කුමක්ද ? යන්න විමසා බලන්න.

# නියෝජ්‍යත්ව ගිවිසුමක් ඇති විය හැකි ආකාර

- නීතියට අනුව වලංගු ගිවිසුමක් ඇතිවිය හැකි සෑම ආකාරයකටම නියෝජ්‍යත්ව ගිවිසුමක්ද ඇති විය හැකිය. එම ආකාරයන් මගින් සහ ඊට අමතරව නීතිය ක්‍රියාත්මක වීම මත තවත් අවස්ථා 4 කදී ද නියෝජ්‍යත්වයක් ඇති විය හැකියි
- ඒවා නම්,
  - 01. ලිඛිතව
  - 02. වාචිකව
  - 03. ව්‍යංගයෙන්
  - 04. නීතිය ක්‍රියාත්මක වීමෙන්
    - ( I ) අවශ්‍යතාවය මත
    - ( II ) අපරානුමැතියෙන්
    - ( III ) ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන්
    - ( IV ) විවාහය සහ සහවාසය මත

# <u>ප්‍රකාශිත ගිවිසුමක් මගින් නියෝජ්‍යත්වයක් ඇතිවීම.</u>

- මෙය ආකාර දෙකකට සිදු වේ. එනම්, ලිඛිතව නියෝජ්‍යත්වයක් ඇතිවීම සහ වාචිකව නියෝජ්‍යත්වයක් ඇතිවීම ලෙසය.

- වාචිකව නියෝජ්‍යත්ව ගිවිසුමක් ඇතිවීම සිදු වන්නේ නියෝජිතයා සහ ප්‍රධානියා අතර වාචිකව ඒ සඳහා එකඟතාවයක් ඇතිවීම මගිනි.

- ලිඛිතව නියෝජ්‍යත්වයක් ඇති වීය හැකි ක්‍රම
  - ■ ලිඛිත ගිවිසුමක් ආකාරයට
  - ■ පෙරකලාසියක් මගින්
  - ■ ඇටෝර්නි බලපත්‍රයක් මගින්

# ව්‍යංගයෙන් නියෝජ්‍යත්වයක් ඇතිවීම

- මෙහිදී සිදුවන්නේ ප්‍රධානියා සහ නියෝජිතයා අතර ලිඛිත හෝ වාචික නියෝජ්‍යත්ව ගිවිසුමක් නොමැති අවස්ථාවකදී, එම දෙපාර්ශවයේ හැසිරීම අනුව ඔවුන් අතර ව්‍යංගයෙන් හෙවත් අප්‍රකාශිතව නියෝජ්‍යත්ව ගිවිසුමක් නිර්මාණය වී ඇති බවට නිතීය විසින් පිලිගැනීමයි.

- **<u>හේලි හචිංසන් එරෙහිව බ්‍රිහෙඩ් ලිමිටඩ්</u>**

  වෙනත් සමාගමක් වන්දි පූර්ණය කිරීම සඳහි ගිවිසුමකට එලඹි සමාගම් අධ්‍යක්ෂකවරයෙකුට ඒ සඳහා ව්‍යංග බලයක් ඇති බව තීරණය විය.

# පාර්ශවයන්ගේ ගිවිසුම් ශක්නුතාවය

- ගිවිසුම් ශක්නුතාවය යනු ගිවිසුම් වලට එළඹීමට ඇති හැකියාවයි.
- බාලවයස්කරුවන්, මානසික නොහැකියාවන්ගෙන් යුතු තැනැත්තන්, බුන්වත් තැනැත්තන් සහ බීමත් තැනැත්තන් ආදින්ට වලංගු ලෙස ගිවිසුමකට එළඹීම සඳහා ගිවිසුම් ශක්නුතාවයක් නොමැති අය ලෙස සැලකේ.
- එහෙත් නියෝජ්‍යත්ව නීතියේදී ප්‍රධාන ගිවිසුම ඇති වන්නේ ප්‍රධානියා සහ තෙවන පාර්ශවය අතරය. එහිදී නියෝජිතයාගේ කාර්යභාරය වන්නේ ප්‍රධානියා වෙනුවෙන් තෙවන පාර්ශවය සමග ගිවිසුම්ගත වීම හෝ ප්‍රධානියා සහ තෙවන පාර්ශවය අතර ගිවිසුමක් ඇතිවීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම හෝ ප්‍රධානියා වෙනුවෙන් යම් කාර්යයක් සිදු කිරීමයි.
- ඒ අනුව මෙහිදී නියෝජිතයා තමා වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීමක් සිදු නොකරයි.
- ඒ අනුව නියෝජිතයාගේ ගිවිසුම් අශක්නුතාවය, ප්‍රධානියා සහ තෙවන පාර්ශවය අතර ඇති වන ගිවිසුම අවලංගු වීමට තරම් හේතුවක් නොවේ.
- ඒ අනුව බාලවයස්කරුවෙකුට හෝ වස්තු භංගත්වයට පත්වූ අයෙකුට වුවද නියෝජිතයෙකු වශයෙන් ක්‍රියා කල හැකි බව නීතියේ පිළිගැනීමයි.

- නියෝජිතයාගේ ගිවිසුම් අශක්නුතාවය මත නියෝජිතයා සහ ප්‍රධානියා අතර ඇති වන නියෝජ්‍යත්ව ගිවිසුමක් බලරහිත විය හැකිය.
- තෙවන පාර්ශවය විසින් නියෝජිතයාට එරෙහිව නියෝජ්‍යත්ව නීතිය යටතේ පවරනු ලබන නඩුවකදී නියෝජිතයාගේ අශක්නුතාවය, එවන් නඩු පැවරීමකට බාධාවක් නොවේ.
- ප්‍රධානියා සහ තෙවන පාර්ශවය අතර ඇතිවන ගිවිසුම බලාත්මක කිරීමට නම් ප්‍රධානියාට මෙන්ම තෙවන පාර්ශවයටද පූර්ණ ගිවිසුම් ශක්නුතාවය තිබිය යුතුයි
- ප්‍රධානියා ඇතැම් අවස්ථා වලදී නියෝජක ලෙසද හැඳින්වේ.

# නීතිය ක්‍රියාත්මක වීම මත නියෝජ්‍යත්වයක් ඇතිවීම

- **අවශ්‍යතාවය මත නියෝජ්‍යත්වයක් ඇතිවීම**
- මෙහිදී සිදුවන්නේ ප්‍රධානියා වෙනුවෙන් නියෝජිතයා විසින් කටයුතු කිරීමේදී අනපේක්ෂිත හදිසි අවස්ථාවකදී පූර්වයෙන් බලය නොලැබූ ක්‍රියාවක් ප්‍රධානියාගේ උපරිම යහපත තකා නියෝජිතයා විසින් සිදු කල විට, එම දෙවන ක්‍රියාව සඳහා එකී ප්‍රධානියා සහ නියෝජිතයා අතර අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වයක් නිර්මාණය වීමයි. එනම් එම ද්විතියික ක්‍රියාව සඳහා එම නියෝජිතයා, ස්වකීය ප්‍රධානියාගේ අවශ්‍යතාවයේ නියෝජිතයෙකු බවට පත්වේ.

- **අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වයක් ඇතිවීම සඳහා තිබිය යුතු අවශ්‍යතා**
- 🎗 අනපේක්ෂිත හදිසි අවස්ථාවක් ඇතිවී එහිදී කෙසේ ක්‍රියා කල යුතුදැයි තම ප්‍රධානියාගෙන් උපදෙස් ලබා ගැනීමට නියෝජිතයාට නොහැකිව තිබිය යුතුය.
- 🎗 අවශ්‍යතාවයේ නියෝජ්‍යත්වයක් ඇතිකර ගැනීම සඳහා සත්‍ය සහ ඒකාන්ත වාණිජ අවශ්‍යතාවයක් තිබිය යුතුය.
- 🎗 නියෝජිතයා විසින් සියලුම පාර්ශවයන්ගේ ( විශේෂයෙන්ම තම ප්‍රධානියාගේ ) උපරිම යහපත වෙනුවෙන් සද්භාවයෙන් ක්‍රියා කර තිබිය යුතුය.

- **<u>ග්‍රේට් නොදර්න් රේල්වේ එරෙහිව ස්වෝෆීල්ඩ්</u>**

නිශ්චිත ගමනාන්තයක් දක්වා අශ්වයෙකු ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන නියෝජිතයෙකුට භාරවිය. අදාල අශ්වයාව ගමනාන්තයේදී භාරගැනීමට පැමිණීමට නියමිතව සිටි පුද්ගලයා නොපැමිණි අතර මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට නියෝජිතයාට තම ප්‍රධානියාව සම්බන්ධ කර ගැනීමටද නොහැකි විය. අශ්වයාගේ උපරිම යහපත තකා නියෝජිතයා විසින් අශ්වයාව ඉස්තාලියක් වෙත යැවීය. ඒ අනුව යම් කාල සීමාවක් අශ්වයාව එහි ගාල් කර තැබුණු අතර අදාල ඉස්තාලි ගාස්තුව ඉල්ලා නියෝජිතයා විසින් පැවරූ මෙම නඩුවේදි අධිකරණය තීරණය කලේ අදාල ද්විතියික ක්‍රියාව සඳහා එම නියෝජිතයා ස්වකීය ප්‍රධානියාගේ අවශ්‍යතාවයේ නියෝජිතයෙකු වන බවයි. ඒ අනුව එම ගාස්තු ප්‍රධානියා විසින් ගෙවිය යුතු වන බව තීරණය විය.

**<u>ස්ප්‍රිංජර් එරෙහිව ග්‍රේට් වෙස්ටර්න් රේල්වේ</u>**

තක්කාලි තොගයක් ප්‍රවාහනය කිරීමට භාරගත් නියෝජිතයෙකු දුම්රිය වැඩ වර්ජනයක් හේතුවෙන් ඒවා නිශ්චිත ගමනාන්තයට ප්‍රවාහනය කිරීමට පෙර ඒවා නරක් විමට ආසන්නව තිබූ බැවින් දේශීය වෙලඳපොලේදී අඩු මුදලකට විකිණීය. එහෙත් මේ පිලිබඳව ප්‍රධානියාගෙන් උපදෙස් ලබා ගැනීමට නියෝජිතයා ක්‍රියා නොකලේය. අධිකරණය මෙහිදී තීරණය කලේ එම නියෝජිතයා තම ප්‍රධානියාගේ අවශ්‍යතාවයේ නියෝජිතයෙකු නොවන බවයි.

- **<u>ප්‍රේජර් එරෙහිව බෝල්ට් ස්පියල් ස්ටැම්ප් ඇන්ඩ් හේකොක් ලිමිටඩ්</u>**

සත්ව සම් මිලදී ගෙන ප්‍රධානියා වෙත යැවීම සඳහා නියෝජිතයෙකු පත් කරනු ලැබීය. පසුව ඇතිවූ යුධමය වාතාවරණය හේතුවෙන් එලෙස මිලදී ගත් සම් ප්‍රධානියා වෙත යැවීමට හෝ ඒ පිලිබඳව තම ප්‍රධානියාගෙන් උපදෙස් ලබා ගැනීමට නියෝජිතයාට නොහැකි විය. පසුව නියෝජිතයා විසින් ඒවා විකුණාන ලදී.

අධිකරණය මෙහිදී තීරණය කලේ දීර්ඝ කාලයක් නිරුපද්‍රිතව ගබඩා කර තබා ගත හැකි එම සම් තොගය විකිණීමට අත්‍යාවශ්‍යතාවයක් නොතිබූ බවත් ඒ අනුව එකී ක්‍රියාව සම්බන්ධයෙන් නියෝජිතයා ස්වකීය ප්‍රධානියාගේ අවශ්‍යතාවයේ නියෝජිතයෙකු නොවන බවයි.

# අපරානුමැතියෙන් නියෝජ්‍යත්වය ඇතිවීම ( අනුමත කිරීම මගින් )

- මෙහිදී සිදු වන්නේ ප්‍රධානියා වෙනුවෙන් කටයුතු කරන නියෝජිතයෙකු විසින් එසේ කටයුතු කිරිමේදී ප්‍රධානියා වෙතින් බලය නොලැබූ යම් ක්‍රියාවක් සිදු කල විට එම ක්‍රියාව සඳහා ප්‍රධානියා විසින් පසුව අනුමැතිය ලබා දීම හේතුවෙන් එම ක්‍රියාව සඳහාද වලංගු නියෝජ්‍යත්වයක් ඇති වීමයි.

# වලංගු අපරානුමැතියක් සඳහා තිබිය යුතු අවශ්‍යතා

♬1. ප්‍රධානියා විසින් ප්‍රකාශිතවම නියෝජිතයාව පත්කර තිබිය යුතුය.

- ♬2. නියෝජිතයා සිය ප්‍රධානියා වෙනුවෙන් කටයුතු කොට තිබිය යුතුයි ( එනම් නියෝජිතයා ඔහුගේ නමින් කටයුතු කොට නොතිබිය යුතුයි )

**කේලි මැක්ස්ටඩ් සහ සමාගම එ. ඩුරන්ට්**

ප්‍රධානියෙකු වෙනුවෙන් තිරිඟු පිටි මිලදී ගැනීම සඳහා පත්කල නියෝජිතයා විසින් වෙළඳපොලෙහි තිරිඟු හිඟ වූ හෙයින් වැඩි මිලක් ගෙවා තිරිඟු මිලදී ගන්නා ලදී. මෙහිදී නියෝජිතයා තුන්වන පාර්ශවය සමග ගනුදෙනු කරන විට තමා මෙම ගිවිසුමට එලඹෙන්නේ ප්‍රධානියෙකු වෙනුවෙන් බව හෙලි කලේ නැත. ප්‍රධානියා විසින් මෙම ගනුදෙනුව අපරානුමත කරන ලදී. පසුව වෙළඳපොලෙහි තිරිඟු මිල පහල ගිය හෙයින් ප්‍රධානියා අදාල තිරිඟු තොගය ප්‍රතික්ෂේප කල අතර ගිවිසුම් කඩ කිරීම යටතේ තුන්වන පාර්ශවය විසින් ප්‍රධානියාට විරුද්ධව පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ නියෝජිතයා විසින් තමා ප්‍රධානියා වෙනුවෙන් ගිවිසුමට එලඹෙන බව තෙවන පාර්ශවයට හෙලි නොකිරීම නිසා මෙහිදී වලංගු අපරානුමැතියක් ඇති නොවන බවත් ඒ අනුව නියෝජිතයා ඊට පෞද්ගලිකව වග කිව යුතු බවත්ය.

- ♬ 3. ගිවිසුමට එලඹෙන දිනයේදී සහ අපරානුමත කරන දිනයේදී ප්‍රධානියාට ගිවිසුම් ශක්නුතාවය තිබිය යුතුය.
- ♬ 4. අපරානුමත කිරීම කරන විට ප්‍රධානියාට එම ගිවිසුමේ වැදගත් කරුණු පිලිබඳව සම්පූර්ණ අවබෝධයක් තිබිය යුතුය.
- ♬ 5. නියෝජිතයා ගිවිසුමට එලඹෙන අවස්ථාවේදී සත්‍ය වශයෙන්ම ප්‍රධානියෙකු සිටිය යුතුය.
  - **<u>කෙල්නර් එ. බැක්ස්ටර්</u>**

    තවමත් සංස්ථාපනය වෙමින් පවතින හෝටල් සමාගමක් වෙනුවෙන් එහි ප්‍රවර්ධකයන් විසින් ණය පදනම මත වයින් මිලදී ගත් අතර අදාල සමාගම සංස්ථාපනය කල පසු එම ගිවිසුම අපරානුමත කළේය. එහෙත් එම මිල ගෙවීමට පෙර සමාගම විසුරුවා හැරි අතර ණය හිමියන් විසින් ප්‍රවර්ධකයන්ට එරෙහිව පැවරූ මෙම නඩුවේදී අධිකරණය තීරණය කලේ එම ගිවිසුමට එලඹෙන අවස්තාවේදී සත්‍ය වශයෙන්ම ප්‍රධානියෙකු නොසිටි බැවින් නියෝජිතයන් ( ප්‍රවර්ධකයන් ) ඊට වග කිව යුතු බවයි.

- ♬6. අපරානුමැතිය දිය හැක්කේ සම්පූර්ණ ගනුදෙනුව සඳහා මිස කොටසක් සඳහා නොවේ.

  මේ සම්බන්ධයෙන් **බෝල්ටර්න් පාර්ට්නර්ස් එරෙහිව ලැම්බර්ට්** නඩු තීන්දුව වැදගත්ය.

- ♬7. අපරානුමත කිරීම නියමිත කාලයක් තුල හෝ සාධාරණ කාලයක් තුල සිදු කල යුතුය.

- ♬8. නියෝජිතයා විසින් එලඹ ඇති ගිවිසුම නීතිවිරෝධී හෝ හිස් ගිවිසුමක් නොවිය යුතුය

  මේ සම්බන්ධයෙන් **බෲක් එ. හුක්** නඩු තීන්දුව වැදගත්ය. කූට ලේඛණයක් අපරානුමත කල නොහැකි බවන මෙහිදී තීරණය විය.

# ප්‍රතිබන්ධන රීතිය මගින් නියෝජ්‍යත්වය ඇතිවීම.

- ප්‍රතිබන්ධන රීතියෙහි සරල අර්ථය නම් යම් දෙයක් සත්‍යය යැයි විශ්වාස කිරීමට යම් පුද්ගලයෙකු විසින් තවත් පුද්ගලයෙකුව පොලඹවා ඇති විට, එය අසත්‍ය යැයි ප්‍රකාශ කිරීමට පසුව එම පුද්ගලයාට නොහැකි බවයි. එනම් යම් පුද්ගලයෙකු තමන්ගේ හැසිරීම මත ( එනම් ප්‍රකාශිත ක්‍රමයකට හෝ තමන්ගේ හැසිරීම මගින් ) වෙනත් පුද්ගලයෙකු තමාගේ නියෝජිතයෙකු බව තුන්වන පාර්ශවයක් වෙත හැඟෙන පරිදි ක්‍රියා කල හොත් සත්‍ය වශයෙන්ම එකී වෙනත් පුද්ගලයා යම් කාර්යයක් සඳහා තමාගේ නියෝජිතයෙකු නොවුනද මෙම ප්‍රතිබන්ධන රීතිය යෙදීමෙන් ඔවුන් දෙදෙනා අතර එකී යම් කාර්යය සඳහා නියෝජ්‍යත්වයක් ඇතිවේ.
- උදාහරණ -

# <u>ප්‍රතිබන්ධන රීතිය මත නියෝජ්‍යත්වයක් ඇතිවීම සඳහා තිබිය යුතු අවශ්‍යතා</u>

- ❤ එවැනි නියෝජ්‍යත්වයක් පිලිබඳව ප්‍රධානියාගේ ප්‍රකාශයක් හෝ හැසිරීමක් තිබිය යුතුය.
- ❤ තුන්වන පාර්ශවය විසින් එම ප්‍රකාශය හෝ හැසිරීම විශ්වාස කිරීම.
- ❤ එම විශ්වාස කිරීමේ ප්‍රතිපලයක් ලෙස තෙවන පාර්ශවය විසින් යම් ක්‍රියාවක් සිදු කිරීම.

මීට අදාලව <u>**POVEY Vs TAYLOR ( පෝවේ එරෙහිව ටේලර් )**</u> නඩු තීන්දුව වැදගත්ය.

# විවාහය සහ සහවාසය මත නියෝජ්‍යත්වය

- රෝම ලන්දේසි නීතියට අනුව සමහර අවස්ථාවන්හිදී විවාහක බිරිඳක් ස්වකීය ස්වාමි පුරුෂයාගේ නියෝජිතයෙකු ලෙස සැලකේමෙකී නීති සංකල්පය මෙරට තුලද ඒ ආකාරයෙන් අදාල වේ. ඒ අනුව ස්වාමි පුරුෂයා සහ භාර්යාව විවාහකව එකම නිවසක වාසය කරන අවස්ථාවකදී ගේදොර අවශ්‍යතා සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ කාර්යය සඳහා බිරිඳක් ස්වකීය සැමියාගේ නියෝජිතයෙකු ලෙස සැලකේ.
- ඔනම් ආහාර, ඇඳුම්, සෞඛ්‍ය, වෛද්‍ය අවශ්‍යතා සඳහා ස්වාමි පුරුෂයා වෙනුවෙන් සහ ඔහුගේ නමින් භාණ්ඩ ණය පදනම මත මිලදී ගැනීමට භාර්යාවකට අයිතියක් ඇත. මේ පිළිබඳව **ලාල්චන්ඩ් එ. සරවනමුත්තු** නඩුවේදී තීරණය විය.
- **ගුණාරිස් හිමි එ. නෝනබබා** නඩුවේදී තීරණය වූයේ තොවිලයක් ශාන්ති කර්මයක් සඳහා ණයට බඩු ලබා ගන්නා බිරිඳක් ස්වකීය ස්වාමි පුරුෂයාගේ නියෝජිතයෙකු නොවන බවයි.
- මේ සම්බන්ධයෙන් **PIANTA Vs MACROW AND SONS** නඩුවෙහිද සඳහන්ය.

- **<u>පහත සඳහන් අවස්ථා වලදී එම විවාහය සහ සහවාසය මත ඇති වන නියෝජ්‍යත්වය අවසන් වේ</u>**

- 1. තමාගේ නමින් ණයට භාණ්ඩ ලබා ගැනීම බිරිඳට තහනම් කර ඇති විටදී
- 2. තමාගේ නමින් ණයට භාණ්ඩ නොසපයන ලෙස වෙළඳසැල් හිමිකරුට ස්වාමි පුරුෂයා විසින් දැනුම් දි ඇති විට
- 3. ස්වාමි පුරුෂයා විසින් අදාල භාණ්ඩ ප්‍රමාණවත් පරිදි භාර්යාව වෙත සපයා ඇති විට හෝ ඒ සඳහා ප්‍රමාණවත් මුදලක් බිරිඳට ලබා දී ඇති විට
- 4. අදාල මිලදී ගැනීම ගේදොර අවශ්‍යතා සඳහා අත්‍යාවශ්‍ය භාණ්ඩ නොවන විට

# නියෝජිතයන් වර්ග

- 1. වෙන්දේසිකරුවෝ
- 2. දේපල නියෝජිතවරු

මොවුන් විසින් ගොඩනැගිලි සහ වෙනත් දේපල විකිණීම, කුලියට දීම සහ කලමනාකරණය කිරීම සිදු කරයි.

- 3. වෙලඳ නියෝජිතවරු

මොවුනට භාණ්ඩ විකිණීම, භාණ්ඩ මිලදී ගැනීම, භාණ්ඩ බෙදාහැරීම හෝ භාණ්ඩ වලට ඇප මත මුදල් ලබා ගැනීමට බලය තිබේ.

- 4. වණික් - යෝජිත සාධකයා ( FACTORS )

මොහුට භාණ්ඩ විකිණීම සඳහා පුළුල් බලතල තිබේ. ඔහුට තමන් සුදුසු යැයි සිතන නියමයන් මත භාණ්ඩ ඔහුගේ නමින්ම භාණ්ඩ විකිණිය හැකිය. තවද ඔහුට ඇප වශයෙන් භාණ්ඩ ඔඩපනය කිරීමද කල හැකිය.

5. කොමිස් නියෝජිතවරු

මොවුන් ප්‍රධානියා වෙනුවෙන් තමන්ගේම නමින්ම වාසි සහගතම තත්වයන් යටතේ භාණ්ඩ මිලදී ගැනීම හෝ විකිණීම සිදු කර ඒ සඳහා කොමිස් මුදලක් ලබයි.

- **<u>නියෝජිතයන් වර්ග ( ඉතිරිය )</u>**

- 6. බ්‍රෝකර්වරු
- 7. ස්ථිර කාරක අධිකාරීන්

අන්තර්ජාතික වෙලඳාමේදී සැපයුම්කරුවෙකුට විදේශ ගනුදෙනුකරුවෙකුගෙන් ඇණවුමක් ලද විට එම ඇණවුම සඳහා තමන්ගේ රටේම පුද්ගලයෙකුගෙන් සනාථ කිරීමක් ඉල්ලා සිටිය හැකිය. මෙබ සනාථ කිරීම ලබා දෙන්නේ ස්ථිර කාරක අධිකාරීන් විසිනි. භාණ්ඩ ගැනුම්කරු ගිවිසුම අනුව කටයුතු කිරීම පැහැර හරින්නේ නම් ස්ථිර කාරක අධිකාරීන් සැපයුම්කරුට වගකිව යුතුය.

- 8. ගෙවීමට යටත් නියෝජිතයා

මොහු ඇපකරුවෙකු ලෙස මෙන්ම නියෝජිතයෙකු වශයෙන්ද ක්‍රියා කරයි. ගැනුම්කරුවන් ඔවුන් ලබාගන්නා භාණ්ඩ සඳහා ගෙවීම් කරන බවට ප්‍රධානියා වෙනුවෙන් ඇතුලත් වන ගිවිසුම් වල ඔහු ඇපකරුවෙකු වශයෙන් අතිරේක කොමිස් මුදලක් මත වගකීම පවරා ගනියි. ඔවුන් විසින් නිසි පරිදි ගෙවීම් නොකරන අවස්ථාවක් වුවහොත් ඔවුන් වෙනුවෙන් මෙම නියෝජිතයා විසින් ගෙවීම් සිදු කරයි.

# නියෝජිතයා සතු අධිකාරී බලය

- මින් අදහස් වන්නේ යම් ප්‍රධානියෙකු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා නියෝජිතයෙකු වෙත ලැබී ඇතැයි සැලකෙන බලයේ ස්වභාවයයි.

## නියෝජිතයා සතු අධිකාරී බලය

- සත්‍ය බලය
  - ප්‍රකාශිත බලය
  - ව්‍යංග බලය
    - සුපුරුදු බලය
    - චාරිත්‍රානුකූල බලය
- පෙනී යන හෝ හැඟී යන බලය / හුවා දැක්වෙන බලය/දෘශ්‍යමාන බලය

- ප්‍රකාශිත බලය

- ව්‍යංග බලය

- දෘශ්‍යමාන බලය

- චාරිත්‍රානුකූල අධිකාරී බලයට උදාහරණ නඩු තීන්දුවක් පහත වේ.
- **<u>ඊ බෙයිලි සමාගම එරෙහිව බෝල්හැම් සිකියුරිටීස් ලිමිටඩ්</u>**

කොකෝවා සහ සිනි වෙලඳාම සම්බන්ධයෙන් කටයුතු කල නියෝජිතයන් තමන්ගේ නමින් කටයුතු කර තුන්වන පාර්ශවයක් වෙත පෞද්ගලිකව වගකීමට යටත් වූහ. එලෙස කටයුතු කිරීමට චාරිත්‍රයක් තිබී ඇති බැවින් ප්‍රධානියා නියෝජිතයාට වගකිව යුතු බව තීරණය විය.

දෘශ්‍යමාන අධිකාරී බලයට උදාහරණ නඩු තීන්දුවක් පහත වේ.

**<u>පැනරෝමා ඩිවෙලොප්මන්ට්ස් එරෙහිව ෆීල්ඩ් ෆර්නිෂිං ෆැබ්‍රික්ස්</u>**

සාප්පුවක සේවකයෙකුට තම ස්වාමියාගේ නමින් සහ ඒ වෙනුවෙන්, පාරිභෝගිකයන් විසින් ඔවුන්ගේ ගනුදෙනු සඳහා කරන ගෙවීම් භාර ගැනීමට දෘශ්‍යමාන අධිකාරී බලයටක් ඇති බව **<u>ද සිල්වා එ. දොන් කරෝලිස් සහ පුත්‍රයෝ</u>** නඩුවේදී තීරණය විය.

# නියෝජිතයෙකුගේ අයිතිවාසිකම් සහ යුතුකම්

- **ප්‍රධානියා වෙත ඇති නියෝජිතයාගේ වගකීම් ( නියෝජිතයාට එරෙහිව ප්‍රධානියාගේ අයිතිවාසිකම් )**
- 1. තම රාජකාරිය ඉටු කිරීමේදි නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරිම සහ තමා සතු විශේෂ කුසලතාවයන් යොදා ගැනීම. ( මෙය නිසි සම්ප්‍රජන්‍යතාවය පිලිබඳ යුතුකම ලෙසද හැඳින්වේ )

**චෞද්‍රි එ. ප්‍රභාකර්** - මෝටර් රථයක් මිලදි ගැනිමේ කාර්යය සඳහා පත්කල නියෝජිතයෙකුට ප්‍රධානියා විසින් උපදෙස් දී තිබුණේ මෝටර් රථය කලින් අනතුරකට භාජනය නොවි ඇති රථයක් විය යුතු බවටයි. නියෝජිතයා විසින් නිර්දේශ කරන ලද මෝටර් රථයක් ප්‍රධානියා විසින් මිලදී ගත් අතර පසුව අනාවරණය වූයේ එය මීට පෙර මාර්ග අනතුරකට ලක්ව ඇති බවයි. නියෝජිතයා ඉහත වගකීම කඩ කර ඇති බවත් ඒ සඳහා ඔහු වගකිව යුතු බවත් තීරණය විය.

- 2. නියෝජිතයා දැනුවත් වූ සියලු වැදගත් කරුණු ප්‍රධානියා වෙත හෙලිකිරීමේ යුතුකම.

**හීත් එරෙහිව පාර්කින්සන්** - නියෝජිතයා දන්නා සියලු වැදගත් කරුණු ප්‍රධානියා වෙත හෙලි කල යුතු බව මෙහිදී තීරණය විය.

- 3. අවශ්‍ය වූ විට ගිණුම් ඉදිරිපත් කිරීම.
- 4. ප්‍රධානියාගේ නිසි උපදෙස් පිලිපැදීම.
- 5. නියෝජිතයාගේ අධිකාරී බලය ප්‍රධානියාගේ අවසරයකින් තොරව වෙනත් අයෙකු වෙත නොපැවරීම.

එනම්, නියෝජිතයාට තමන් වෙත පැවරුන කාර්යය වෙනත් අනු නියෝජිතයෙකු වෙත අභිනියෝජනය කල නොහැකිය. මෙම සිද්ධාන්තය DELEGATUS NON POTEST DELEGARE ලෙස හැඳින්වේ.

මෙම රීතියට ඇති ව්‍යතිරේඛ පහත පරිදිය.

- ප්‍රධානියා විසින් ඒ සඳහා අනුමැතිය දුන් විට
- එලෙස අනුනියෝජිතයෙකු පත්කිරීම පිලිබඳව ප්‍රධානියා දැනගෙන ඒ සඳහා විරුද්ධ නොවී සිටීම.
- එම අනුනියෝජ්‍යත්වය ප්‍රදානියා විසින් අපරානුමත කිරීම.
- නියෝජිතයා නෛතික පුද්ගලයෙකු වන විට
- වෘත්තියේ හෝ රැකියාවේ සුපුරුදු පරිචයන් අනුව එලෙස සිදු වන විට
- නියෝජිතයාට පැවරුන කාර්යය පෞද්ගලික දක්ෂතාවය හෝ විශ්වාසයක් අවශ්‍ය නොවන හුදු සාම්ප්‍රදායික කටයුත්තක් වන විට

- 6. ප්‍රධානියාගේ රහස්‍ය තොරතුරු ඔහුගේ අවසරයකින් තොරව හෙළි නොකිරීම.
- 7. ප්‍රධානියාගේ උපරිම යහපත සහ ප්‍රතිලාභය තකා ක්‍රියා කිරීම.

**<u>මැක්පර්සන් එරෙහිව වොට්</u>** - දේපලක් විකුණාදීම සඳහා භාරගත් නියෝජිතයෙකු එම දේපල මුලින් තම සහෝදරයාට මිලදී ගැනීමට සලස්වා පසුව ඔහු මාර්ගයෙන් තමා මිලදී ගත්තේය. මෙහිදී නියෝජිතයා තම වගකීම් කඩකොට ඇති බව අධිකරණය තීරණය කලේය.

8. රහස් ලාභ ලබා නොගැනීම.

**<u>ඩී බුස්චි එ. ඇල්ට්</u>** - නැවක් විකිණීමේ කාර්යයක් භාරගත් නියෝජිතයෙක් ඒ සඳහා ගැනුම්කරුවෙකු සොයාගත නොහැකි වු බැවින් තමාගේ නමින් නැව මිලදී ගෙන පසුව වැඩි මිලට එය විකුණා විශාල ලාභයක් ලැබීය. ප්‍රධානියාගේ දැනුමකින් තොරව රහස් ලාභයක් ලබා ගෙන ඇති බව මෙහිදී තීරණය වූ අතර ඒ සඳහා නියෝජිතයා තම ප්‍රධානියාට වගකිව යුතු විය.

**<u>හිපිස්ලි එරෙහිව නී</u>** - නියෝජිතයා ලබා ගන්නා ලාභය පිලිබඳව ප්‍රධානියා විසින් දැනගෙන ඊට එකඟ වූ විට එය රහස් ලාභයක් නොවේ.

# <u>නියෝජිතයා විසින් රහස් ලාභයක් ලබා ගෙන ඇති විට ප්‍රධානියාට ඒ සම්බන්ධව ඇති ප්‍රතිකර්ම</u>

- නියෝජිතයාගෙන් එම රහස් ලාභය අය කර ගැනීම.
- නියෝජිත ගිවිසුම අවසන් කිරීම.
- නියෝජිතයාට කොමිස් හෝ වේතනය ගෙවීම ප්‍රතික්ෂේප කිරීම.
- නියෝජිතයාව පෙර දැනුම්දීමකින් තොරව පහ කිරීම.

**<u>බොස්ටන් ඩීප් සී ෆිෂිං සමාගම එරෙහිව ඇන්සෙල්</u>** - බෝට්ටු ඇනවුම් කිහිපයකින් බෝනස් සහ කොමිස් ලෙස රහස් ලාභයක් ලබා ගත් සමාගම් අධ්‍යක්ෂකවරයෙකු ලෙස කටයුතු කල නියෝජිතයෙකුව සේවයෙන් පහ කිරීමට ප්‍රධානියාට අයිතියක් ඇති බව තීරණය විය.

# ප්‍රධානියාගේ අයිතිවාසිකම් සහ යුතුකම්

- නියෝජිතයාට ඔහුගේ වැටුප් හෝ කොමිස් මුදල් ලබා දීම.
- නියෝජිතයා විසින් සිය අධිකාරී බලය ක්‍රියාත්මක කිරීමේදී සිදුකරන නීත්‍යානුකූල ක්‍රියාවන් සඳහා නියෝජිතයාට වන්දි පූර්ණය කිරීම.

- ඉහත සඳහන් කල නියෝජිතයා සතු වන්දි පූර්ණය කිරීමේ අයිතිය පහත අවස්ථාවලදී ඔහුට අහිමි වේ.
  - නියෝජිතයා විසින් තමාගේ බලය ඉක්මවා කටයුතු කර ඇති විටකදී
  - නියෝජිතයා විසින් නොසැලකිලිමත් අයුරින් කටයුතු කර ඇති විටකදී

# නියෝජිතයා සතු ලියමේ අයිතිය

- ලියමේ අයිතිය යනු වෙනත් පුද්ගලයෙකුට අයිති දේපලක් සම්බන්ධයෙන් තවත් පුද්ගලයෙකුට ඇති අයිතියකි.
- ඒ අනුව ලියමේ අයිතිය හෙවත් කැප අයිතිය යනු වෙනත් පුද්ගලයෙකුට හිමි දේපලක්, එම පුද්ගලයාගෙන් තමාට අය වීමට ඇති යම් මුදලක් හෝ ණයක් ගෙවා අවසන් කරන තුරු එය සන්තකයේ ඇති පුද්ගලයාට එකී දේපල දැරීමට ඇති අයිතියයි.
- තමා වෙත පවරන ලද කාර්යක් අවසන් කල නියෝජිතයෙකුට තවමත් ඒ සඳහා ප්‍රධානියාගෙන් එකඟ වූ පරිදි ගෙවීම් ලැබී නොමැති නම් එම ගෙවීම් ලැබෙන තෙක් තමා භාරයේ ඇති ප්‍රධානියාට අයත් භාණ්ඩ ප්‍රධානියා වෙත මුදා නොහැර සිටිමේ අයිතිවාසිකම නියෝජිතයා සත ලියමේ අයිතිවාසිකම ලෙස හැඳින්වේ.

# නියෝජ්‍යත්වයක් අවසන් වීම

- මෙය පහත ආකාර දෙකට සිදුවිය හැකිය.
  - 1. පාර්ශවයන්ගේ ක්‍රියාවකින්
  - 2. නීතිය ක්‍රියාත්මක වීමෙන්

## 1. පාර්ශවයන්ගේ ක්‍රියාවකින් නියෝජ්‍යත්වයක් අවසන් වීම.

මෙය පහත ආකාර වලට සිදුවිය හැකිය.

- ඉටුකිරීම මත
- කඩ කිරීම මත ( උදා - රහස් ලාභ ලැබීම )
- පාර්ශවයන්ගේ අන්‍යෝන්‍ය එකඟතාවය මත
- ප්‍රධානියා විසින් නියෝජිතයාගේ අධිකාරී බලය අහෝසි කිරීමෙන්

## නීතිය ක්‍රියාත්මක වීම මගින් නියෝජ්‍යත්වයක් අවසන් වීම.

- ප්‍රධානියා හෝ නියෝජිතයාගේ මරණයෙන්

- ප්‍රධානියා හෝ නියෝජිතයා බංකොලොත්භාවයට පත්වීමෙන්

- ප්‍රධානියා හෝ නියෝජිතයා මානසික අශක්නුතාවයට පත්වීමෙන්

ප්‍රධානියාගේ මානසික අශක්නුතාවය මත නියෝජ්‍යත්ව ගිවිසුම අවසන් වුවද, නියෝජිතයා විසින් එම අශක්නුතාවය පිලිබඳව නොදැන සිටින තෙවන පාර්ශවයක් සමග සිදු කරනු ලබන ගනුදෙනුවලින් ප්‍රධානියා තවදුරටත් බැඳේ.

ඩෘව් එරෙහිව නූන් - ස්වාමි පුරුෂයෙක් තම භාර්යාවට ඩෘව් වෙතින් භාණ්ඩ මිලදී ගැනීමට අධිකාරී බලය ලබා දුනි. ඉන් අනතුරුව ස්වාමි පුරුෂයා ( ප්‍රධානියා ) මානසික අශක්නුතාවයට පත්වූ අතර භාර්යාව ( නියෝජිතයා ) නොකඩවාම ඩෘව් වෙතින් භාණ්ඩ මිලදි ගත්තාය. ඩෘව් ස්වාමි පුරුෂයාගේ මෙම අශක්නුතාවය පිලිබඳව දැන සිටියේ නැත. අධිකරණය මෙහිදී තීරණය කලේ ඒ සඳහා ඩෘව්ට ගෙවීම් කිරීමට ස්වාමි පුරුෂයා බැඳී සිටින බවයි.

- **<u>නීතිය ක්‍රියාත්මක වීම මගින් නියෝජ්‍යත්වයක් අවසන් වීම ( ඉතිරිය )</u>**

- ● කාලය ගෙවී යාම මත

- ● ප්‍රධානියා සහ නියෝජිතයා පසුව සතුරු රටවල් වල වැසියන් වීම

**<u>ස්ටීවන්සන් සහ පුත්‍රයෝ එරෙහිව ඇක්ට් ෆර් කාර්ටන්ජන් ඉන්ඩස්ට්‍රීස්</u>**

ප්‍රධානියා සහ නියෝජිතයා එක්සත් රාජධානිය සහ ජර්මනියේ වැසියන් වූ අතර පසුව එම රටවල් දෙක අතර යුද්ධයක් ඇති විය. සතුරන් අතර නියෝජ්‍යත්වයක් වලංගු නොවන බැවින් මෙම නියෝජ්‍යත්ව ගිවිසුම අවසන් වන බව තීරණය විය.

- ● නියෝජ්‍යත්ව ගිවිසුම පසුව අනීතික වීම හෝ ව්‍යර්ථ වීම මගින්

උදාහරණ -

# ගිවිසුම් සම්බන්ධයෙන් නියෝජිතයකුගේ වගකීම

- මෙය පහත කොටස් තුන යටතේ අධ්‍යයනය කෙරේ.
  - නියෝජිතයා විසින් නම් කල ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීම.
  - නියෝජිතයා විසින් නම් නොකල ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීම.
  - නියෝජිතයා විසින් හෙලි නොකල ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීම.

**<u>නියෝජිතයා විසින් නම් කල ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීම.</u>**

ප්‍රධානියෙකු වෙනුවෙන් කටයුතු කරන නියෝජිතයෙකු විසින් තමා අසවල් ප්‍රධානියා වෙනුවෙන් කටයුතු කරන බව තෙවන පාර්ශවය වෙත දන්වා ඇත්නම් එකී ගිවිසුම සම්බන්ධයෙන් වන නෛතික වගකීම ප්‍රධානියා සහ තෙවන පාර්ශවය වෙත පවතී.

**<u>නියෝජිතයා විසින් නම් කල ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීම.</u>**

මෙහිදී ප්‍රධානියෙකු වෙනුවෙන් කටයුතු කරන නියෝජිතයෙකු විසින් විසින් තමාට ප්‍රධානියෙකු ඇති බව හෙලි කරන නමුත් ප්‍රධානියා කවුරුන්ද යන වග නම් නොකරයි. මෙවන් ගිවිසුම් වලදී නියෝජිතයා පෞද්ගලිකවම තෙවන පාර්ශවයට වගකිව යුතු නැත.

- <u>**නියෝජිතයා විසින් හෙලි නොකල ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිසුම් වලට එලඹීම.**</u>

- මෙහිදී සිදුවන්නේ නියෝජිතයා විසින් තෙවන පාර්ශවය වෙත, ප්‍රධානියෙකු ඇති බව හෝ ප්‍රධානියා කවුරුන්ද යන වග හෙලි නොකිරීමයි. එනම් තමා ප්‍රධානියා බවට හඟවා තෙවන පාර්ශවය සමග ගිවිසුම් ගත වීමයි. ඒ අනුව අදාල ක්‍රියාවන් සඳහා නියෝජිතයා පෞද්ගලිකවම තෙවන පාර්ශවයට වගකිව යුතුය.
- එහෙත් හෙලිනොකල ප්‍රධානියාට තමා ප්‍රධානියා බවට පවසා තෙවන පාර්ශවය සමග එම ගිවිසුම බලාත්මක කල හැකිය. මෙම රීතිය <u>**හෙලි නොකල ප්‍රධානියාගේ වාදය**</u> හෝ <u>හෙලි නොකල ප්‍රධානියා සම්බන්ධ රීතිය</u> ලෙස හැඳින්වේ. මෙවිට අදාල ගිවිසුම සම්බන්ධ සියලු වගකීම ප්‍රධානියා වෙත පැවරේ.
- ප්‍රධානියාව සොයාගත් පසු ඒ දෙදෙනාගෙන් එක් පාර්ශවයක් වගකීමට යටත් කිරීමට හෝ නඩු පැවරීමට නියෝජිතයාට වරණයක් ඇත. එහිදී තෙවන පාර්ශවය විසින් එක් වරණයක් තෝරාගත් පසු එය වෙනස් කිරීමට තෙවන පාර්ශවයට අවසර නැත.

# නියෝජිතයා තෙවන පාර්ශවය වෙත පෞද්ගලිකවම වගකීමට යටත් වන අවස්ථා

- තමා නියෝජිතයෙකු ලෙස ගිවිස ගන්නා බව තෙවන පාර්ශවය වෙත දන්වා නොමැති විට
- නොපවතින ප්‍රධානියෙකු වෙනුවෙන් ගිවිස ගන්නා විට  උදා -
- නියෝජිතයෙකු බව පැහැදිලිව නොදක්වා විනිමය බිලක නියෝජිතයාගේ නම ඇති විට
- නියෝජිතයා සත්‍ය වශයෙන්ම ප්‍රධානියා වන විට
- ගිවිසුමේ ස්වභාවය සහ අවස්ථානුගත කරුණු අනුව නියෝජිතයා වගකිව යුතු වන විට
- නියෝජිතයාට අධිකාරී බලයක් නොමැති විට හෝ එය ඉක්මවා කටයුතු කරන විට
- නියෝජිතයා වගකිව යුතු බවට වෙළඳ චාරිත්‍රයක් ඇති විට
- නියෝජිතයා තමාගේ නමින් ඔප්පුවක් අත්සන් කරන විට

# නියෝජිතයෙකුගේ ක්‍රියා සඳහා රජයේ වගකීම

- මේ සම්බන්ධයෙන් 1969 අංක 22 දරණ දිලික්ත වැරදි පිලිබඳ රාජ්‍ය වගකීමේ පනත මගින් ප්‍රතිපාදන සපයයි.
- **රජය වගකිව යුතු නියෝජිතයෙකුගේ ක්‍රියා**

♥ යම් ලිඛිත නීතියක් යටතේ රජයේ නියෝජිතයෙකුට යම් කාර්යයක් පවරා ඇති අවස්ථාවකදී එම නියෝජිතයා විසින් එකී කාර්යය ඉටු කරන විට දිලික්තයක් සිදු කිරීම.

♥ රජයේ අධිකාරි බලය ඇතිව වෙලඳ ලකුණක් හෝ ප්‍රකාශන අයිතියක් උල්ලංගනය කිරීම

- **රජය වගකිව යුතු නොවන නියෝජිතයෙකුගේ ක්‍රියා**

♥ තැපැල් භාණ්ඩ සම්බන්ධ රජයේ නියෝජිතයෙකුගේ මොනයම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක්

♥ රාජකාරියේ යෙදී සිටිව සන්නද්ධ හමුදා සාමාජිකයෙකුගේ ක්‍රියාවක් හෝ පැහැර හැරීමක්

♥ අධිකරණමය ස්වභාවයෙන් කටයුතු කිරීමකදී රජයේ නිලධාරියෙකුගේ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක්

# පසුගිය විභාග ප්‍රශ්න